# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2026.02.24 පැය 2145 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 336 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**2026 T- 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ ශ්‍රී ලංකා - නවසීලන්ත තරගයට අදාලව කොළඹ නගරය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන රථවාහන සැලැස්ම.**

2026.02.25 දින රාත්‍රී 0700 ට මාළිගාවත්ත ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට නියමිත 2026 T 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ ශ්‍රී ලංකාව හා නවසීලන්තය අතර තරඟය නැරඹීම සඳහා දේශීය හා විදේශීය ප්‍රේක්ෂකයින් විශාල ප්‍රමාණයක් පැමිණෙතැයි අපේක්ෂා කෙරේ. එම තරඟයට අදාලව රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කොළඹ රථවාහන කොට්ඨාසය විසින් පහත පරිදි සැලසුම් කර ඇත.

❖ **ක්‍රියාත්මක කරනු ලබන රථවාහන සැලැස්ම පහත පරිදි වේ.**

**පහත මාර්ගයන්හි අවස්ථානුකූලව රථවාහන ගමනාගමනය සීමා කරනු ලැබේ.**

- වින්සන් පෙරේරා මාවත (ග්‍රෑන්ඩ්පාස් පාර), බ්‍රිටෝ බබාපුල්ලේ පාලම පෙදෙස හන්දියෙන් බබාපුල්ලේ දෙසට ඇතුල්වීම.
- බබාපුල්ලේ පාලම අසලින් ක්‍රීඩාංගනය දෙසට ඇතුළු වීම.
- සෙබස්තියන් ඇල පාර මැල්වත්ත පාලම අසලින් ක්‍රීඩංගනය දෙසට ඇතුළු වීම.
- අඩි 100 පාර, පන්සල පාර හන්දියෙන් ක්‍රීඩාංගනය දෙසට ඇතුළු වීම.
- මාළිගාවත්ත පටුමග, ක්‍රීඩාංගනය අසලින් අතුරු මාර්ගයෙන් ක්‍රීඩාංගනය දෙසට ඇතුළු වීම.
- සද්ධර්ම මාවත පන්සල් පාර (බෙත්තාරාම පාර) හන්දියෙන් පන්සල පාරට ඇතුළු වීම.

**රථවාහන ගාල් කිරීම.**

- ආර්.ප්‍රේමදාස ක්‍රීඩාංගනය වටා ඇති රථගාල් වලට අමතරව ග්‍රෑන්ඩ්පාස් මැටිපාක් රථගාල, සතොස රථගාල, සෙබස්තියන් ඇල රථගාල, කෝවිල පාර, ඇපල් වත්ත, අඩි 100 පාර දෙපස රථගාල් කිරීමට පහසුකම් සපයා ඇත.

ප්‍රේක්ෂකයන්ගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් හා සිවිල් ඇඳුමින් සැරසුනු බුද්ධි නිලධාරීන් යෙදවීමට කටයුතු කරනු ලබන අතර විශාල ප්‍රමාණයේ ගමන්මළු, විදුරු බෝතල්, ඩ්‍රෝන උපකරණ, කුඩා මුවහත් පිහි, මත්ද්‍රව්‍ය හා මත්පැන් රැගෙන ඒම තහනම් වනු ඇත.

සී.සී.ටී.වී. දර්ශණ පරික්ෂා කිරීම්, ශරීර පරීක්ෂා කිරීම් හා වාහන සෝදිසි කිරීම් තරඟය ආරම්භ වීමට පෙර සිට ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා ආරක්ෂක අංශවලට අවශ්‍ය සහාය ලබාදෙන සියලු නරඹන්නන්ගෙන් පොලිසිය ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**